

JVP–මාලිමා සන්ධානය සම්ප්‍රදායික දේශපාලන මාර්ගයේ ගමනක?

ජනතාවගේ ඊළඟ තීරණය කුමක් වෙයි ද?

**සුදත් චන්ද්‍රසේකර**

**හැඳින්වීම**

2019–2024 කාලය ශ්‍රී ලංකා දේශපාලනයේ සරල පක්ෂ මාරුවක් නොව, සමාජ–දේශපාලන පද්ධතියේ ගැඹුරු අසාර්ථකත්වයට ජනතාව විසින් දැක්වූ ප්‍රබල ප්‍රතිචාරයක් ලෙස සැලකිය යුතුයි. ආර්ථික අර්බුදය, රාජ්‍ය ආයතනික අසාර්ථකත්වය, පවුල් පාලනය, දූෂණය, සහ පක්ෂීය අධිකාර කරණය එකට එකතු වූ විට, ජනතාවගේ දේශපාලන මනස තුළ සම්ප්‍රදාය බිඳ දැමීමේ සහ නව පාලනයක අවශ්‍යතාව තදින් ගොඩනැගුණා. JVP–මාලිමා සන්ධානය විසින් කරුණු ලැබූ ප්‍රචාරණ යන්ත්‍රණය සහ සන්නිවේදනය ජනතාවගේ හදවත් තුලට තදින් ම දැනෙන්ට හේතු වුනා.

**JVP–මාලිමා සන්ධානය 3% සිට ජයග්‍රහණය දක්වා**

මෙම පසුබිම තුළ JVP–මාලිමා සන්ධානය පැරණි පක්ෂ සංස්කෘතියට විරුද්ධ විකල්පයක් ලෙස ජනප්‍රියත්වය දිනා ගත්තේ ය. 3% පමණ වූ මූලික ඡන්ද පදනමකින් ජයග්‍රහණය දක්වා ගිය ඔවුන්ගේ ගමන නව දේශපාලන විප්ලවයක් ලෙස සැලකිය හැකි වුවත්, බලය ලැබීමෙන් පසු ඔවුන් මුහුණ දුන්නේ තමන් විවේචනය කළ සම්ප්‍රදායික පක්ෂ මාර්ගයට ම ඇද වැටීමේ අවදානමටයි.

හිටපු කථානායක අශෝක රංවලගෙන් ආරම්භ වූ මැති ඇමතිවරුන්ගේ උගත්කම් ගැටලු, කථානායකවරයාට විරුද්ධව සහ ඇමතිවරුන්ට එරෙහි චෝදනා, සහ කන්ටේනර්–ගල් අගුරු වැනි දූෂණ චෝදනා ඔවුන්ගේ "පිරිසිදු පක්ෂ" හැඩයේ වෙනසක් කිරීමට දැඩි බලපෑමක් විය. ප්‍රතිපත්ති අසංවිධානය, අත්දැකීම් අඩු පාලනය, සහ IMF යටතේ ඇති ප්‍රායෝගික සීමා ඔවුන්ගේ අතීත දේශපාලන කථා වලට විරුද්ධ තත්ත්වයක් උදා කළේ ය.

**පාලන රටාවේ ඇති සෘජු වෙනස්කම්**

එහෙත් පාලන රටාවේ ඇති සෘජු වෙනස්කම් කීපයක් ජනතාවට දැනෙන්නට විය. V8-ඩිෆෙන්ඩර් මෝටර්කේඩ් අඩු වීම, පොලිස් එස් කෝට් අඩු වීම, පාරවල් වැසීම නැති වීම, රාජ්‍ය වාහන භාවිතය අඩු වීම, මන්ත්‍රී විශ්‍රාම වැටුප් අහෝසි කිරීම පාර්ලිමේන්තු කෑම මිල ඉහල දැමීම, දැඩි මූල්‍ය විනය රටේ පාලන රටාව වෙනස් කිරීමේ ලකුණු ලෙස සැලකිය

හැක. මෙම සාධනීය කරුණු ඉදිරියට පවත්වා ගෙන යෑම ඉදිරියේ දි බලයට පත් වන සෑම පාලනයකින් ම ජනතාව බලාපොරොත්තු වනු ඇත.

**ජනතාවගේ නව තීරණ මාර්ගය**

මෙම තත්ත්වය තුළ ජනතාව නැවතත් නව විකල්පයක් සොයන මනෝභාවයකට ඇද වැටීම ස්වාභාවිකයි. නමුත් ජනතාවට තදින් දැනෙන ප්‍රබල විපක්ෂයක අවශ්‍යතාව සපුරාලීමට ප්‍රබල විපක්ෂයක් නොමැති වීම කනගාටුවට කරුණකි. ජනතාව දැන් තීරණ ගන්නේ පක්ෂ නාම, පැරණි නායකයින් හෝ ඉතිහාස මත නොව, තම ජීවිතය, ආර්ථිකය, සහ අනාගතය මතය. 2022 අරගලයෙන් පසුව ජනතාවගේ මනස තුළ ගොඩනැගුණු නව සත්‍යය වන්නේ පාලන කාර්යක්ෂමතාව, දූෂණ විරෝධය, ආර්ථික ප්‍රතිඵල, සහ ජීවන තත්ත්වය යන මූලික සාධක සහිත නිවහල් පිරිසිදු පාලනයක් බව කිව යුතු ය.

**සුදත් චන්ද්‍රසේකර**

සුදත් චන්ද්‍රසේකර ශ්‍රී ලංකා දේශපාලන ක්ෂේත්‍රයේ අවුරුදු 40කට වැඩි පළපුරුද්දක් ඇති ජ්‍යෝෂ්ඨ පරිපාලන හා සන්නිවේදන විශේෂඥයෙකි. ඔහු කැබිනට් අමාත්‍ය, විපක්ෂ නායක සහ අග්‍රාමාත්‍ය පුද්ගලික ලේකම් සහ උපදේශක ලෙස සේවය කළ අතර, එක්සත් ජාතික පක්ෂ මාධ්‍ය ඒකකයේ, සන්නිවේදන බලකායේ අධ්‍යක්ෂ ජනරාල් ලෙසද කටයුතු කළා.